# දේව සංකල්පය සහ සිංහල බෞද්ධයා

**මධුෂා සඳරුවනි සමරකෝන් [1], මධුෂා සඳරුවනි සමරකෝන් [2]**

නවීකරණයත් සමඟ ජනප්‍රිය බුදු දහමේ විවිධ අංගයන් ලංකාව තුළ ස්ථාපිත වනු දක්නට ඇත. එහි දී සිංහල බෞද්ධයන් විසින් බෝධි වන්දනාව, දේව වන්දනාව වැනි අංගයන් කෙරේ යොමු වීම ඒ අතරින් සුවිශේෂී වේ. නූතන සිංහල සමාජය ලොව නොවිසඳෙන සංකීර්ණ ගැටළු රාශියකට මුහුණපා තිබේ. මෙහි දී තමාගේ චර්යා පාලනය කිරීමටත්, අනුන්ගේ චර්යා පාලනය කිරීමටත්, අපරාධකරුවන්ගේ චර්යා පාලනය කිරීමටත්, බුදුන් ඇදහීමට වඩා වර්තමානය වන විට දෙවියන් කෙරෙහි විශ්වාසය තැබීමට නැඹුරු වී ඇති බව පෙනේ.

මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සමීක්ෂණ ක්‍රමය හා තුලනාත්මක ක්‍රමය යොදා ගන්නා ලදී. එමෙන් ම මෙහි දී දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම වශයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය සහ නිරීක්ෂණ ක්‍රමය යොදා ගනිමින් පුද්ගලයන් 100 දෙනෙකුගෙන් යුත් අහඹු නියැදියක් භාවිතයට ගැනුණි. එහිදී අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ සමන් දේවාල භූමියට පැමිණෙන බැතිමතුන් යොදා ගැනුණි.

වර්තමානයේ බොහෝ දෙනෙක් අධ්‍යාත්මික සංවර්ධනයට වඩා භෞතික සංවර්ධනය අපේක්ෂා කරති. මෙම අධ්‍යයනයේ නිගමනය වන්නේ "දේව ඇදහීම" එම භෞතික සංවර්ධනය කරා යාමට මෙවලමක් වශයෙන් යොදා ගන්නා බවයි. සංකීර්ණ සමාජයේ ඇතිවන විවිධ ගැටළුවලට විසඳුමක් වශයෙනුත්, මානසික සහනය සඳහාත් දෙවියන් යදින බවය. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ ථේරවාදී බුදු දහම රැකී ඇත්තේ දේව සංකල්පය නිසා බව පැහැදිලි වන කරුණකි.

**ප්‍රමුඛ පද:** ජනප්‍රිය බුදු දහම, දේව සංකල්පය, සංකීර්ණ සමාජය
**Title:** concept of "God" and Sinhala Buddhist
**Keywords:** popular Buddhism, deity concept, complex society

---

1 සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: madu300@yahoo.com

2 සමාජ විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: thilinidayananda@yahoo.com